# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් රාජ්‍ය  කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය-2018

1.0 සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල පදනම් කරගනිමින් කුසලතා අනුපිළිවෙල මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනමින් සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත. විභාගය 2018 ජූලි මස දී පැවැත්වීමට නියමිතය.

3.0 පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම නොපිරවීම පිළිබඳ අවසාන තීරණය ගැනීමේ බලය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

4.0 තනතුරට හිමි වැටුප් පරිමාණය : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III, II හා I වැනි ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු.28,940-10x300-11x350-10x560-10x660-47990/- ක් වන අතර, එම වැටුප හිමිවන්නේ 2020.01.01 දින සිට වේ. ඉහත චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ. රු. 31,940 න් ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස්වීම ද, රු. 35,790 න් ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස්වීම ද ලබාගත යුතුය.

5.0 මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතු වේ.

## 6.0 සුදුසුකම්

සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළවේ.

(අ). අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු අතර, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වයෙන් වූ අවුරුදු පහක් (05) ඇතුළත ඔහු/ ඇය එම දිස්ත්‍රික්කය තුළ යටත් පිරිසෙයින් අවුරුදු තුනක් (03)වත් අඛණ්ඩව ස්ථිර වශයෙන් පදිංචිව සිටි අයෙකු විය යුතු අතර, එසේ වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචිය අයදුම්කරුට නොමැත්තේ නම් අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ අයදුම්කරුගේ කලත්‍රයා සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(ආ) 2018.04.06 දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2000.04.06 දින හෝ ඊට පෙර හා 1988.04.06 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ඇත.)

(ඇ) i. යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යට තත්ත්වයකින් යුක්ත විය යුතුය.

ii. සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2018.04.06 දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

(ඈ) පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(1) . සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(2). අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර සියලුම විෂයන්ගෙන් එකවර සමත්ව තිබීම.

(විෂයය 04ක් සහිත වූ පැරණි විෂය නිර්දේශය යටතේ විෂය 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

## 7.0 විභාග පරිපාටිය

(අ) විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වන අතර, මෙම විභාගය සිංහල ,දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍ය වලින් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්නපත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| | | ලකුණු | කාලය |
|---|---|---|---|
| (i) | භාෂා හැකියාව | 100 යි | පැය 2 1/2 යි |
| (ii) | අභියෝග්‍යතාව | 100 යි | පැය 1 යි |

**භාෂා හැකියාව** - මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, භාෂාව හා රචනය, දෙන ලද ලිපියක් කෙටුම්පත් කිරීම, සපයා ඇති දත්ත අනුව ප්‍රස්තාර වගු සකස් කිරීම , දී ඇති පාඨ සාරාංශ කිරීම, දී ඇති වාක්‍ය, කිහිපයක අදහස් තනි වාක්‍යයකින් ලිවීම සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**අභියෝග්‍යතාව** - මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාවත් , තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**සටහන :**

I. රාජකාරී කටයුතු සඳහා අපේක්ෂකයන්ගේ සුදුසුකම් හා හැකියාව පරීක්ෂා කිරීම පිණිස මෙම ප්‍රශ්න පත්‍ර සකස් කෙරේ.

II. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් ම නොපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

(ආ) මෙම විභාගය තරග විභාගයක් වුව ද පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් වත් (40%) අපේක්ෂකයන් විසින් ලබාගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් (50%) ලබාගත යුතුවේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් මුළු ලකුණු මත පදනම් වූ දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් ලබාදෙනු ලැබේ.

8.0 පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3 % ක් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයින් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3 % ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබාදීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයන්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් 50 % ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරා ගනු ලැබූ අපේක්ෂකයකු විශේෂ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතුය.

## 9.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

## 10.0 විභාග ගාස්තු

විභාග ගාස්තුව රු. 600/- කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතුවේ.

11.0 විභාගය පැවැත්වීමට යෝජිත නගර ( ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| නගරය | නගර අංකය |
|---|---|
| කෑගල්ල | 23 |
| රත්නපුර | 24 |

## 12.0 අයදුම්පත්‍ර

A 4 ( 21 cm x 29 cm) ( සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි දෙපැත්තම භාවිත කරමින්

(අ). අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු වන පිටුවට ද,

(ආ). අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙළ කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව හා විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත්ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

(ඇ). අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද , දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(ඈ) ආබාධිත අයදුම්කරුවන් අයදුම්පතේ ඉහළින් "**ආබාධිත අයදුම්කරුවෙකි**" යන්න හා කුමන ආබාධිතයෙක් ද යන බව රතු පාටින් පැහැදිලිව සඳහන් කළ යුතුවේ.

(ඉ) අයදුම්පත්‍රයේ 1.1 යටතේ අයදුම්කරුගේ නම සඳහන් කිරීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නමෙහි අගටම යෙදෙන කොටස පළමුව ලියා, පෙළපත් නාමයට අදාළ නම්වල මුලකුරු හා නමෙහි අනෙකුත් කොටස් වල මුලකුරු ඊළඟට වන සේ ලිවිය යුතුය.

උදා: අයදුම්පත්‍රයේ 1.2 අනුව සම්පූර්ණ නම -MATHURATA GAMARALALAGE BUDDIKA SARATH KUMARA PERERA නම්

උදා: අයදුම්පත්‍රයේ 1.1 හි - PERERA, M.G.B.S.K. ලෙස ලිවිය යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන , නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය අලවා නොමැති, නියමිත සුදුසුකම් සහ අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍රය කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. විභාග ගාස්තු ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය හැර වෙනත් කිසිදු සහතිකයක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් නොකළ යුතුය.

12.1. නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ඉඩදෙනු ලැබේ. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "**සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2018**" යන්න හා ඔබ පදිංචි දිස්ත්‍රික්කය ද සඳහන් කරන්න.

12.3 අයදුම්පත්‍රය අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු , දිවුරුම් කොමසාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 2,40,360 /- ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

12.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2018.04.06 දිනට හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

**ලේකම්**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**සබරගමුව පළාත් සභා සංකීර්ණය,**
**නවනගරය, රත්නපුර.**

12.5 **විභාග ප්‍රතිඵල**

මෙම නිවේදනයේ 7 (ආ) ඡේදයට අනුව ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දීමෙන් අනතුරුව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල තැපැල් මගින් හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.result.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

13.0 **විභාගයට පෙනී සිටීම**

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළවී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍ර යේ හා මුදල්ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙනම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

14.0 අපේක්ෂකයන්ගේ අනන්‍ය තාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15.0 අපේක්ෂකයකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17.0 සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**2018.03.07දින**
**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,**
**සබරගමුව පළාත් සභා සංකීර්ණය,**
**නවනගරය, රත්නපුර.**

**සුනේත්‍රා ගුණවර්ධන**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**සබරගමුව පළාත.**

| සබරගමුව පළාත් රාජ්‍ය සේවය | 09 |
|---|---|

## ආදර්ශ අයදුම්පත්‍රය

### සබරගමුව පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2018

### Open Competitive Examination for Recruitment to Grade III of Sabaragamuwa Provincial Public Management Assistants Service -2018

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය

සිංහල -2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

- විභාග නිවේදනයට අනුව ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය හා නගර අංකය සඳහන් කරන්න. (විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර සහ නගර අංක විභාග නිවේදනයේ 11.0 ඡේදය බලන්න)

| නගරය | නගර අංකය |
|---|---|
| | |

- ඔබ විභාගයට පෙනී සිටින්නේ ගැසට් නිවේදනයේ 8.0 ඡේදයේ ප්‍රකාරව, ආබාධිත පුනරුත්ථාපන කොන්දේසි යටතේද? ඔව් - 1 නැත - 2
(මෙම කොටසේ ඔව් ලෙස සඳහන් කළයුත්තේ ආබාධිත අයදුම්කරුවන් පමණක් වන බැවින් පිරවීමට පෙර විභාග නිවේදනයේ 8.0 හා 12 (ආ) ඡේද හොඳින් කියවන්නේ නම් මැනවි)

ආබාධිත අයදුම්කරුවකු නම් කුමන ආබාධිතයෙක්ද යන්න රතුපාටින් පැහැදිලිව ලියන්න

- අයැදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය
කෑගල්ල - 23
රත්නපුර - 24
(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

1.0 1.1 මුල්'කුරු අගට යොදා මුල්'කුරු සමඟ නම
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, M. G. B. S. K.

1.2 සම්පූර්ණ නම
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම
( සිංහලෙන් / දෙමළෙන්)

1.4 හැඳුනුම්පත් අංකය

2.0 2.1 ස්ථිර ලිපිනය : ..........
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය : ..........
( සිංහලෙන් / දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : ..........
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 පෞද්ගලික දුරකථන අංකය

3.0 3.1 ස්ත්‍රී /පුරුෂ භාවය 0 - පුරුෂ
1 - ස්ත්‍රී
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන්දිනය වර්ෂය මාසය දිනය

3.3 2018.04.06 දිනට වයස අවුරුදු මාස දින

4.0 4.1 සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිය ඇත්තේ අයදුම්කරු ද? කලත්‍රයා ද? යන වග ..........

4.2 උප දිසාපති/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ..........

4.3 සබරගමුව පළාත තුළ පදිංචිව සිටින්නේ කවදා සිට ද? ..........

4.4 ග්‍රාම නිලධාරී කොට්ඨාශය ..........

5.0 අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර

I. විභාගයේ වර්ෂය හා මාසය :
II. විභාග අංකය :
III. ප්‍රතිඵල :

| විෂයය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

5.2 අ.පො.ස(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර

I. විභාගයේ වර්ෂය හා මාසය:
II. විභාග අංකය:
III. ප්‍රතිඵල:

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |

6.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
( අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | | නැත | |
|---|---|---|---|

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය:
(ii) ලදුපතේ අංකය හා දිනය:
(ii) ගෙවූ මුදල:

**ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න**
**(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)**

8.0 අයැදුම්කරුගේ සහතිකය

(අ) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය : අයදුම්කරුගේ අත්සන

9.0 අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන .......... මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු / ඇය මා ඉදිරිපිට දී .......... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

දිනය : සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)